# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2022/18 - 2017 ජුනි මස 07 වැනි බදාදා - 2017.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1837/8 හා 2013.11.19 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 1.1 (අ), 5.1, 5.2, 10.4.1 (iii) හා 11.1(අ) ලෙස දැක්වෙන වගන්ති පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

බී. ජී. එස්. ගුණතිලක,
ලේකම් (වැ.බ.),
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2017 ජුනි මස07 වැනි දින,
කොළඹ 10,
අංක : 385,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ දී ය.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාව

1.1(අ)

ශ්‍රී ලංකා හෙද සේවයේ III, II, I ශ්‍රේණි,
I ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා/මහජන සෞඛ්‍ය/අධ්‍යාපන) - රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

අධි ශ්‍රේණිය හා අධි ශ්‍රේණිය (රෝහල් සේවා/මහජන සෞඛ්‍ය/අධ්‍යාපන) - රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය සේවා කමිටුව

5.1

| *අනුමත තනතුරු නාම* | *තනතුරු අනුමත ශ්‍රේණිය* | *අනුමත තනතුරු සංඛ්‍යාව* |
|---|---|---|
| මාණ්ඩලික හෙද | ශ්‍රී ලංකා හෙද සේවය - III, II, I හා අධි ශ්‍රේණිය | 22936 |
| I ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා) | ශ්‍රී ලංකා හෙද සේවය - I ශ්‍රේණිය | 938 |
| අධි ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා) | ශ්‍රී ලංකා හෙද සේවය - අධි ශ්‍රේණිය (රෝහල් සේවා) | |

1A - G 25679 — 09 (2017/06)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5.1

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| I ශ්‍රේණියේ හෙද නිලධාරි (අධ්‍යාපන) | ශ්‍රී ලංකා හෙද සේවය - I ශ්‍රේණිය | 248 |
| අධි ශ්‍රේණියේ හෙද නිලධාරි (අධ්‍යාපන) | ශ්‍රී ලංකා හෙද සේවය - අධි ශ්‍රේණිය (අධ්‍යාපන) | |
| I ශ්‍රේණියේ හෙද නිලධාරි (මහජන සෞඛ්‍ය) | ශ්‍රී ලංකා හෙද සේවය - I ශ්‍රේණිය | 51 |
| අධි ශ්‍රේණියේ හෙද නිලධාරි (මහජන සෞඛ්‍ය) | ශ්‍රී ලංකා හෙද සේවය - අධි ශ්‍රේණිය (මහජන සෞඛ්‍ය) | |
| මාණ්ඩලික හෙද විශේෂ ශ්‍රේණිය (රෝහල් සේවා) | ශ්‍රී ලංකා හෙද සේවාවේ විශේෂ ශ්‍රේණිය | 180 |
| මාණ්ඩලික හෙද විශේෂ ශ්‍රේණිය (අධ්‍යාපන) | ශ්‍රී ලංකා හෙද සේවාවේ විශේෂ ශ්‍රේණිය | 98 |
| මාණ්ඩලික හෙද විශේෂ ශ්‍රේණිය (මහජන සෞඛ්‍ය) | ශ්‍රී ලංකා හෙද සේවාවේ විශේෂ ශ්‍රේණිය | 04 |
| හෙද අධ්‍යාපන ක්ෂේත්‍රයේ හෙද විදුහල්පතිවරු | ශ්‍රී ලංකා හෙද සේවාවේ විශේෂ ශ්‍රේණිය | 18 |
| අධ්‍යක්ෂ (හෙද අධ්‍යාපන, හෙද මහජන සෞඛ්‍ය, හෙද වෛද්‍ය සේවා) | ශ්‍රී ලංකා හෙද සේවාවේ විධායක ශ්‍රේණිය | 03 |

5.2

ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව

| | | |
|---|---|---|
| (අ) | මාණ්ඩලික හෙද III, II, I හා අධි ශ්‍රේණිය | 22936 |
| (ආ) | I වන ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) | 1237 |
| (ඇ) | අධි ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා/මහජන සෞඛ්‍ය/අධ්‍යාපන) | |
| (ඈ) | විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) | 282 |
| (ඉ) | හෙද අධ්‍යාපන ක්ෂේත්‍රයේ හෙද විදුහල්පතිවරුන් | 18 |
| (ඊ) | අධ්‍යක්ෂ (හෙද අධ්‍යාපන, හෙද මහජන සෞඛ්‍ය, හෙද වෛද්‍ය සේවා) | 03 |

(රාජ්‍ය සේවයේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි කලින් කලට මෙම සංඛ්‍යාව වෙනස් විය හැක)

10.4.1 **(iii)**

ජාතික හෙද අධ්‍යාපන ආයතනය/පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල විසින් පවත්වනු ලබන වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය/ඉගැන්වීම හා අධීක්ෂණය/මහජන සෞඛ්‍ය හෙදකම හා වින්නඹු කර්මය/මානසික හෙදකම අඩංගු අවුරුදු 1 1/2ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා I වන ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා, හෙද අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) තනතුරක හෝ අධි ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා, හෙද අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) තනතුරක හෝ එම තනතුරු දෙකෙහිම හෝ වසර පහ (05) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

11.1 (අ)

| | |
|---|---|
| 1 වන ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා/මහජන සෞඛ්‍ය/අධ්‍යාපන)<br><br>අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා/මහජන සෞඛ්‍ය/අධ්‍යාපන) | දැනට (i) (ii) (iii) සහ (iv) ලෙස සඳහන් කර ඇති සුදුසුකම් වලට පහලින් පහත සටහන ඇතුළත් වේ.<br><br>සටහන<br><br>1. මෙම තනතුරට පත් කරනු ලබන 1 වන ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා, මහජන සෞඛ්‍ය, අධ්‍යාපන) තනතුරු නාමය හෙද සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ද, අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා, මහජන සෞඛ්‍ය, අධ්‍යාපන) තනතුරු නාමය හෙද සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ද භාවිතා කළ යුතු ය.<br>2. 1 වන ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා, මහජන සෞඛ්‍ය, අධ්‍යාපන) තනතුරු දරන නිලධාරීන් හෙද සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3 වගන්ති අනුව සිදුකරනු ලැබේ.<br>3. 1 වන ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා, මහජන සෞඛ්‍ය, අධ්‍යාපන) තනතුරක සේවයේ යෙදී සිටින නිලධාරීන් අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා, මහජන සෞඛ්‍ය, අධ්‍යාපන) තනතුරට පත්වීම හේතුවෙන් නිල ඇඳුම් හෝ දැනට දරන තනතුරට අදාළ වගකීම් වල වෙනසක් සිදු නොවේ. |

06 - 745

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.